# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2116/7 - 2019 මාර්තු මස 26 වැනි අඟහරුවාදා - 2019.03.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු ආඥාපනත (235 වන අධිකාරය) යටතේ නිවේදන

1988 අංක 83 දරන පනත මගින් සංශෝධනය කරන ලද රේගු ආඥා පනතේ 22 (අ) වගන්තියෙහි උප වගන්ති (1) සහ (2) යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සිදු කරන ලද නිවේදන මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2019 මාර්තු මස 26 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

### රේගු ආඥාපනත 22 (අ) වගන්තියෙහි උපවගන්ති (1) සහ (2) යටතේ නිවේදන

1988 අංක 83 දරන පනත මගින් සංශෝධනය කරන ලද රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 22 (අ) වගන්තියෙහි (1) සහ (2) වැනි උපවගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, 1998.11.11 දිනැති අංක 1053/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රය, එහි පළවූ නියෝග අංක 04 ට ඉක්බිතිවම පහත දැක්වෙන නව වගන්තිය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කරමි.

4.1 මෙම යෝජනා ක්‍රමය යටතේ කළු ගම්මිරිස්, පුවක්, සාදික්කා/වසාවාසි, සියඹලා සහ කුරුඳු ආනයනය සඳහා අවසර දෙනු නොලැබේ.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 මාර්තු මස 26 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

04 - 393

1A - PG 4453 — 567 (2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.